# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1838/2 - 2013 නොවැම්බර් මස 25 වැනි සඳුදා - 2013.11.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ කටුවන ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

මිය යාම හේතු කොට ගෙන කටුවන ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ආරියදාස වීරසිංහ ගමආරච්චිගේ නම් වූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ කටුවන ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන සරඹගේ සුගතදාස මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කටුවන ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි වේවැල්වල හේවගේ රවින්ද්‍ර විජය කුමාර වන මම, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, සරඹගේ සුගතදාස මහතා කටුවන ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඩබ්. එච්. ආර්. විජය කුමාර,
තේරීම්භාර නිලධාරි,
කටුවන ප්‍රාදේශීය සභාව.

2013 නොවැම්බර් මස 15 වන දින,
මැතිවරණ කාර්යාලය,
හම්බන්තොට.

12 - 368/1

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය යටතේ කටුවන ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයේ පුරප්පාඩුව පිරවීම**

මිය යාම හේතු කොට ගෙන කටුවන ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ, සභාපති වන ආරියදාස වීරසිංහ ගමආරච්චිගේ නම් වූ සභාපති අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් වන්නාවූ, ඒ කටුවන ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉඹුලහිටිය ගමාච්චි මහින්ද මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කටුවන ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි වේවැල්වල හේවගේ රවීන්ද්‍ර විජය කුමාර වන මම, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ඉඹුලහිටිය ගමාච්චි මහින්ද මහතා කටුවන ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඩබ්. එච්. ආර්. විජය කුමාර,
තේරීම්භාර නිලධාරි,
කටුවන ප්‍රාදේශීය සභාව.

2013 නොවැම්බර් මස 15 වන දින,
මැතිවරණ කාර්යාලය,
හම්බන්තොට.

12 - 368/2

---

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය යටතේ රත්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයේ පුරප්පාඩුව පිරවීම**

මධ්‍යම පළාත් සභාවට තේරී පත්වීම හේතු කොට ගෙන රත්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ, සභාපති වන තල්ගස්වත්තේ දොන් ජයතිස්ස නම් වූ සභාපති අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් වන්නාවූ, ඒ රත්තොට ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඇස්. කේ. ජයන්ත පුෂ්පකුමාර මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

රත්තොට ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි සුදු දේවගේ ශානික අනුරුද්ධ රූපසිංහ වන මම, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ඇස්. කේ. ජයන්ත පුෂ්ප කුමාර මහතා රත්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. ඩී. එස්. ඒ. රූපසිංහ,
තේරීම්භාර නිලධාරි,
රත්තොට ප්‍රාදේශීය සභාව.

2013 නොවැම්බර් මස 18 වන දින,
මැතිවරණ කාර්යාලය,
මාතලේ.

12 - 369

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.